DOI: 10.31357/fhssmst.2009.00042

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නිවාස ණය පිළිබඳ ප්‍රචාරක ව්‍යාපෘතිය.

MA/MU/0014

දෙවුන්දර ලියනගේ කුසුම්ලතා වර්ණකුලසූරිය විසිනි.

27 NOV 2009

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන ශාස්ත්‍රපති උපාධිය සඳහා වූ පර්යේෂණ නිබන්ධය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නිවාස ණය පිළිබඳ ප්‍රචාරක ව්‍යාපෘතිය.

MA/MU/0014

දෙවුන්දර ලියනගේ කුසුම්ලතා වර්ණකුලසූරිය විසිනි.

ජනසන්නිවේදන ශාස්ත්‍රපති GS/HU/1624/2002

පිදුම

උසස් අධ්‍යාපන කටයුතු සඳහා

සැමවිටම මා දිරිමත් කල,

මෙම පර්යේෂණ නිබන්ධය සඳහා

අනුපමේය සහයක් ලබා දුන්

දයාබර සැමියාටත්

කසුන්, අරුණ, නිපුණ

මා ආදරණීය දරු තිදෙනාටත්

දහසකුත් දුෂ්කරතා මැද

උසස් අධ්‍යාපනය දක්වා මා රැගෙනගිය

මා පෝෂණය කල

අම්මාටත්, තාත්තාටත්

ඉමහත් භක්ත්‍යාදරයෙන් යුතුව

මෙම කෘතිය පිළිගන්වමි

- ස්තූතිය -

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ අධ්‍යයන අංශ ප්‍රධානී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න මැතිතුමා, ජනසන්නිවේදන ශාස්ත්‍රපති ඒකකයේ පාඨමාලා අධ්‍යක්ෂා මහාචාර්ය තිස්ස කාරියවසම් මැතිතුමා, මහාචාර්ය ධම්මික ගංගානාත් දිසානායක මැතිතුමා, අධ්‍යයන කටයුතු හදාරන කාලය තුල උපදෙස් ලබා දුන්, ඇදුරු මඩුල්ල, අධ්‍යයන අංශයේ කාර්ය මණ්ඩලය පශ්චාත් උපාධි පීඨයේ පීඨාධිපතිතුමිය ඇතුළු අනෙකුත් නිලධාරී මඩුල්ල සහ එම කාර්ය මණ්ඩලය, මෙම නිබන්ධය සැකසීමේ දී නන් අයුරින් සහාය ලබා දුන් සියළු දෙනාට මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පිරිනමමි.

පටුන

පිටු අංකය

❖ හැඳින්වීම. - 1 - 2

1. ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමයෙහි ප්‍රභවය හා සංවර්ධනය. - 3 - 15

2. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ආරම්භය එහි ක්‍රියාකාරිත්වය හා ආයතනික ව්‍යුහය. - 16 - 22

3. බැංකුවේ අරමුණු හා දැනට ක්‍රියාත්මක නිවාස ණය ව්‍යාපෘති. - 23 - 32

4. සේවා අලෙවියේදී හඳුනාගත් ශක්‍යතා හා දුබලතා. - 33 - 42

5. අලෙවි හා ප්‍රචාරණ මෙවලමක් ලෙස ගණුදෙනුකාර සේවාව. - 43 - 60

6. අරමුණු දර්ශණය හා සංගත වටිනාකම. - 61 - 95

7. සමාලෝචනය. - 96 - 97

8. ආශ්‍රිත ග්‍රන්ථ - 98 -

හැඳින්වීම

ගෝලීය ආර්ථික රටාව තුල බැංකු කරු මූලික වශයෙන් සේවා අලෙවිකරණයේ නියැලෙන ව්‍යාපාරික ආයතනයකි. අතරමැදිකරණය (මුදල් තැන්පතු භාර ගැනීම හා මුදල් ණයට දීම) තම මූලික ව්‍යාපාරය වෙතත් වර්තමානයේදී මෙම මූලික අරමුණු වලින් බැහැරව රක්ෂණ, කල්බදු සහ ආයෝජන උපදෙස් දීම වැනි විවිධ මූල්‍ය සේවා කටයුතු ද සළසයි. රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයෙන්ම බැංකු ආයතන රාශියක් තරඟකාරී ලෙස සිය ව්‍යාපාරික කටයුතු මෙහෙයවීම වර්තමානයේ සිදුවේ. ගණුදෙනුකරුවන් තුල ඇතිවන පාරිභෝගික චර්යා වෙනසට අනුව බැංකුව නිරතුරුවම මෙහෙයුම් හා මූල්‍ය අවධානමකට ලක්වේ. සිය වෙළඳපොළ කොටස රැකගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කිරීමට පෙළඹේ. මේ සඳහා ක්‍රමවත් අලෙවිකරණ සැලැස්මක් අවශ්‍ය වේ. ඒ සැලැස්ම සමස්ත බැංකු ක්‍රියාවලියේම ප්‍රධාන මෙවලමයි. ගුණාත්මක ණය කළඹ මෙන්ම ගුණාත්මක ගණුදෙණුකාර සේවාවද ක්‍රමවත් සංගත සැළැස්මක් ද මගින් ඇති කරන සුමට ක්‍රියාවලියද බැංකුවේ ප්‍රතිරූපය ඉහලින් පවත්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය කරුණු වේ.

මූල්‍ය ආයතනයක් ලෙසින් රටේ නිවාස ණය වෙළඳපොළ කොටසින් 21% ක් හිමිකරගෙන සිටින රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව දශක හතක් පුරා සිය ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය නොබිඳී පවත්වා ගැනීමට ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය ශාඛා කාර්යාල එක්ව කටයුතු කරමින්, ජාතික නිවාස අවශ්‍යතාවයන් සපුරාගැනීමට ඉමහත් දායකත්වයක් ලබා දේ. ඒ සඳහා ඔවුනගේ "නිවාස ණය කළඹ" වැදගත් වේ.

සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයක්, විධායක බලැති සාමාන්‍යාධිකාරී වරයෙක් සහ ඉහළ ආයතනික කළමණාකාරීත්වයකින් සැදුම් ලත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව භාරසීයකට ආසන්න සේවක මණ්ඩලයකින් ද සමන්විත වේ. බැංකුවේ අභිවෘද්ධිය සඳහා ඔවුන් සිය වටිනාම සම්පත ලෙස සළකන්නේ ගණුදෙනුකාර ප්‍රජාවයි. ප්‍රධාන ව්‍යාපාරික මෙහෙවර නම් නිවාසකරණය සඳහා මුදල් සැපයීම හා ඉතිරිකිරීම් ප්‍රවර්ධනයයි.

බැංකුවේ මූල්‍ය තත්වය 2007 වර්ෂයේ රුපියල් මිලියන 23.7 ක් වූ අතර එය 2008 වර්ෂයේදී රුපියල් මිලියන 41.2 දක්වා වැඩිවී ඇත. මුදාහරින ලද උකස් ණය හා සේවක අර්ථසාධක ණය ප්‍රමාණය රුපියල් මිලියන 2977 කි. එය පෙර වසරට වඩා 12%ක වැඩිවීමකි.

එසේම බැංකුව සිය ආයතනික හා සමාජ වගකීම් සම්බන්ධයෙන්ද ක්‍රියාකාරකම් රැසකට සම්බන්ධ වී සිටී. දරුවන් අතර ඉතුරුම් පුරුදු ඇතිකිරීම, රණවිරු සුභසාධන කටයුතු, ආගමික ක්‍රියාකාරකම් හා සමාජ සේවා කටයුතු ද ඒ අතර වේ.

"ජාතියේ නිවාස බැංකුව" ලෙස ඔවුන් සිය ඉලක්ක කණ්ඩායම් වෙත මූල්‍ය පහසුකම් සළසා දෙන අතර අඩු ආදායම් ලාභීන් අරමුණු කරගෙනද ප්‍රශස්ථ ණය ක්‍රම හඳුන්වා දී ඇත. රාජ්‍ය බැංකුවක ඇති මූල්‍ය සුරක්ෂිතතාවය මෙන්ම විශ්වසනීයත්වයද සිය බැංකු කටයුතු කරගෙන යාමේදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ලබා ඇති භාග්‍යකි.

ඒ සඳහා ප්‍රචාරණ හා අලෙවි අංශයේ මැදිහත් වීමද විශේෂයෙන් සැලකිය යුතුය. බැංකුවේ ඉදිරි පෙළ ව්‍යාපාර කටයුතු නවීකරණය කිරීම සහ සිත් ඇදගන්නා සුළු පරිශ්‍රය කටයුතු ද වැදගත් වේ.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ නිවාස ණය පිළිබඳ ප්‍රචාරණ ව්‍යාපෘතිය නිබන්ධනය වෙනුවෙන් කරුණු රැස්කිරීමේ දී ආයතනික ව්‍යුහය, ශාඛා ජාලය, බැංකුවේ සංගත සැළැස්ම, සන්නිවේදනය, අළෙවි හා මහජන සම්බන්ධතා අංශයේ ක්‍රියාකාරකම් පිළිබඳවද සේවක ප්‍රජාව පිළිබඳවද අපගේ මූලික අවධානය යොමු කළෙමු.

1

ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමයෙහි ප්‍රභවය හා සංවර්ධනය

ඓතිහාසික පසුබිම

විසිවන සියවසේ මුල් දශකයේදී කෘෂි කාර්මික අංශය ද්විත්ව මුහුණුවරක් ගත්තේය.යැපුම් මට්ටමේ කෘෂි බෝග වගාව මෙන් වැවිලි ක්ෂේත්‍රයේ මැනවින් සංවිධානය වූ අපනයන කෘෂි අංශයක් ද ඇතිවිය. එතෙක් පැවතුනු මූල්‍යාමය හා ණය විධිවිධානයන් විදේශීය පාලනයක් යටතේ හුදෙක් ආනයන අපනයන වෙළදාම සහ වැවිලි අංශය පමණක් අරමුණු කර ගත් බැවින් දේශීය අවශ්‍යතාවයන්ට අනුව විධිමත් වූ මූල්‍ය සේවාවන් වල අවශ්‍යතාවය ව්‍යාපාරිකයන්ට දැනෙන්නට විය. 1931 වසරේදී ඩොනමෝර් ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමගම විදේශීය “විනිමය බැංකු” හතකින්, යුරෝපීයන් සතු පෞද්ගලික බැංකු දෙකකින් සහ ඉන්දීය බැංකු ශාඛා තුනකින් ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය ක්‍රියාත්මක වන්නට විය.

ආර්ථික විවිධාංගීකරණයේදී සහ කාර්මික කරණයේදී බැංකු සේවාවන් වර්ධනයේ ලා මුල් ඩොනමෝර් යුගයේදී විශේෂ උනන්දුවක් ඇතිවිය. 1931 “රාජ්‍ය උකස් බැංකුවත්’, 1932 දී “ලංකා සේවිංස්”බැංකුවත් ආරම්භ වූයේ ඒ අනුවයි. ශ්‍රී ලංකාවේ එවකට පැවති කෘෂි කාර්මික, කාර්මික හා වානිජ යන අංශ සඳහා බැංකු හා මූල්‍ය සේවා සැපයීමේ ලා ගත හැකි ඵලදායී පියවර සොයා බලා වාර්තාවක් සකසන ලෙස “ලංකා බැංකු කටයුතු කොමිෂන් සභාව” නමින් කොමිසමක් පත් කරන ලදී. එය 1934 දී සෙරාබ්ජී පොක්නවාලා ගේ ප්‍රධානත්වයෙන් වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර රාජ්‍ය අනුග්‍රහය ලබන බැංකු සහ සාර්ථක දේශීය බැංකු පිහිටුවීමේ අවශ්‍යතාවය පිළිබඳ සොයා බලා නිර්දේශයන් ඉදිරිපත් කිරීම මෙම කොමිසම පිහිටුවීමේ පරමාර්ථය විය.

පොක්නවාලා කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශයන් සැලකිල්ලට ගෙන රාජ්‍ය අනුග්‍රහය ලබන දේශීය බැංකුවක් ලෙස ලංකා බැංකුව පිහිටවූ අතර 1939 දී එහි ව්‍යාපාරික කටයුතු ආරම්භ විය. දේශීය ව්‍යාපාරික අංශය සඳහා මින් මූල්‍ය හා බැංකු සේවා පහසුකම් සලසන ලදී.

1950 දී ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ විය. 1952 දී සංවර්ධන බැංකු කටයුතු වල නියැලිය හැකි ලෙස ලංකා බැංකු පනතට සංශෝධන ඉදිරිපත් කරන ලදී. 1950 දී ප්‍රථම සංවර්ධන බැංකුව වන "සංවර්ධන මූල්‍ය සංස්ථාව" පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ වෙනස්වන ග්‍රාමීය ආර්ථික ප්‍රතිපත්තීන්ට අනුකූලව බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා මහජන බැංකුව පිහිටුවන ලදී. 1961 අංක 29 දරණ මහජන බැංකු පනත යටතේ එය පිහිටවනු ලැබිනි.

ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීම ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසුව බැංකු හා ආර්ථික ප්‍රතිපත්තීන් සම්බන්ධව රජය විසින් ගනු ලැබූ වැදගත් තීරණයකි.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කරන ලද "වානිජ බැංකු මෙහෙයුම්" නම් වූ 40 වන සංවත්සර මෙහෙයුම් කලාපයේ (1950-1990) බැංකු ක්‍රමයේ මෑත කාලීන සංවර්ධනය යුග තුනකට බෙදා දැක්වෙයි.

- 1951-1960 - සාම්ප්‍රදායික බැංකු යුගය.
- 1961-1976 - සමාජ හා සංවර්ධන බැංකු යුගය.
- 1977-1990 - නවීන හා නවීකාරක බැංකු යුගය.

1841 දී ප්‍රථම බද්ධ ව්‍යාපාරික වානිජ බැංකුව ලෙස "බැන්ක් ඔෆ් සිලොන්" පිහිටුවන තෙක් මෙරට ව්‍යාපාරික ප්‍රජාවගේ මූලික මූල්‍ය අවශ්‍යතාවයන් සපුරන ලද්දේ "චෙට්ටියාර්" වරුන් විසිනි.අපනයන කෘෂි බෝගයක් ලෙස කෝපි වෙළඳාම ව්‍යාප්ත වීමත් සමග බැංකු හා මූල්‍ය සේවාවන්හි වැඩි දායකත්වයක් ව්‍යාපාරික ප්‍රජාවට අවශ්‍ය විය. මේ නිසා "බැන්ක් ඔෆ් සිලොන්" සහ "ඔරියන්ටල් බැන්ක්" ඒකාබද්ධ වීමෙන් "ඔරියන්ටල් බැන්කිං කෝපරේෂන්" පිහිටවිනි. එම බැංකුවේ බිඳ වැටීමත්, කෝපි කර්මාන්තයේ බිඳ වැටීමත් නිසා නවතම කෘෂි අපනයන බෝගයක් ලෙස තේ වගාව වෙත ව්‍යාපාරිකයන් නැඹුරු විය. මේ නිසා තරමක අර්බුදයකට මුහුණ දුන් වෙළඳ හා විනිමය බැංකු කරුවෝ වඩාත් ශක්තිමත් හා ශක්‍යතාවයකින් යුත් පදනමක් මත ක්‍රියාත්මක වීම කෙරෙහි අවධානය යොමු කළහ.

මේ කාලයේදී වැවිලි ක්ෂේත්‍රයේ මුල් තැනක් ගෙන කටයුතු කල බ්‍රිතාන්‍ය බැංකු "සාම්ප්‍රදායික බ්‍රිතාන්‍ය බැංකු රටාව" තුල කටයුතු කිරීමට පටන් ගති. මේ නිසා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට අමතරව "නිවාස දේපළ සංවර්ධනයේ නිරත ව්‍යාපාරිකයන්ට" සහයෝගය දීමට තීරණය කරන ලදී.

ලංකා බැංකුව පිහිටුවීම.

1938 අංක 53 දරණ ආඥාපනත යටතේ පිහිටවූ "ලංකා බැංකුව" ශ්‍රී ලංකාවේ පළමු පෞද්ගලික දේශීය බැංකුවයි. එය 1939 ව්‍යාපාර කටයුතු ආරම්භ කලහ. ලංකා බැංකුව සාම්ප්‍රදායික බැංකු පරිචයන් මතම පිහිටා කටයුතු කල නමුදු දේශීය ව්‍යාපාරික ප්‍රජාව සඳහා ඉමහත් සේවයක් සලසන ලදී. පසුකලෙක 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත 1952 අංක 19 දරණ බැංකු පනත මගින් සංශෝධනය කරමින් "සංවර්ධන ණය ප්‍රදානය" සඳහා අවසර දෙන ලදී. බැංකුවට ස්ථාවර හෝ නිශ්චල දේපළ සුරැකුම් වලට එරෙහිව අත්තිකාරම් ප්‍රදානය කිරීමටත් බැංකුව විසින් බදු වශයෙන් ලබාගන්නා ඉඩම් වල හෝ වෙනයම් දේපලක ඉදිකිරීම්, වැඩි දියුණු කිරීම් හෝ සංවර්ධනය කිරීමටත් ඉඩකඩ මේ සංශෝධන මගින් සැලසිනි.

මහජන බැංකුව පිහිටුවීම.

1961 අංක 29 දරණ පනත මගින් ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය දියුණු කිරීමටත්, ග්‍රාමීය අංශයට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් සැපයීමත්, ග්‍රාමීය බැංකු කටයුතු මෙහෙය වීමත් අරමුණු කරගෙන මහජන බැංකුව පිහිටුවන ලදී. සමූපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීමත්, කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින් වෙත මූල්‍ය පහසුකම් සැලසීමත් ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකත්ව ගොඩ නැගීමත් ඉන් බලාපොරොත්තු විය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව පිහිටුවීම.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1975 අංක 13 දරණ උකස් හා ආයෝජන බැංකු පනත යටතේ සංස්ථා ගත වූ සංස්ථාපිත මණ්ඩලයකි. එහි ප්‍රධාන කාර්යාලය කොළඹ 03 ගාලුපාරේ අංක 269 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර මූලස්ථාන ශාඛාවට අමතරව ප්‍රාදේශීය ශාඛා කාර්යාල කිහිපයකින්ද සමන්විත වෙයි. ගම්පහ ශාඛාව, මහනුවර ශාඛාව, ගාල්ල ශාඛාව, කුරුණෑගල ශාඛාව, මතුගම ශාඛාව, හලාවත ශාඛාව,මාතර ශාඛාව සහ ව්‍යාප්ති කාර්යාල 5කින්ද සමන්විතයි. බත්තරමුල්ල ව්‍යාප්ති කාර්යාලය, කිරිබත්ගොඩ ව්‍යාප්ති කාර්යාලය, කෑගල්ල ව්‍යාප්ති කාර්යාලය, හොරණ ව්‍යාප්ති කාර්යාලය, අම්බලන්ගොඩ ව්‍යාප්ති කාර්යාලය ලෙස ඒවා හැඳින්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය 11 දෙනෙකුගෙන් සමන්විත වේ. වර්තමාන බැංකුවේ සභාපති තනතුර දරණු ලබන්නේ තිමිර රාජපක්ෂ මහතායි. බැංකුවේ සාමාන්‍යාධිකාරී ධූරය අජිත් වීරසිංහ මහතා විසින් දරණු ලබයි.

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික අංශය වන්නේ නිවාස මූල්‍ය ප්‍රතිපාදන, කෘෂිකාර්මික හා කාර්මික ණය, වාර හා ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යාම ආයතනික ආයෝජනයයි.

1975 අංක 13 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ අංක 6 යටතේ මේ පනතේ විධි විධාන වලට යටත්ව 31 වන වගන්තියෙහි සඳහන් වෙන් වෙන්ව ව්‍යාපාර කටයුතු වර්ග පවත්වාගෙන යාමට සහ ඒවායේ කටයුතු කිරීමට බැංකුව වෙත බලය පවරා දී ඇත.

i. යම් කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගෙන තිබෙන හෝ ප්‍රයෝජනයට ගැනීමට තිබෙන යම් ඉඩමක් මිලදී ගැනීමේ හෝ බදු ගැනීමේ හෝ ඒ ඉඩම වගා කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ දියුණු කිරීමේ;

ii. යම් කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයකට සම්බන්ධව ප්‍රයෝජනයට ගෙන තිබෙන හෝ ප්‍රයෝජනයට ගැනීමට තිබෙන යම් ගොඩනැගිල්ලක්, කර්මාන්ත, ශාලාවක්, මෝලක්, පතලක්, යන්ත්‍රයක් හෝ උපකරණයක් මිලදී ගැනීමේ හෝ බදු ගැනීමේ හෝ තැනීමේ හෝ අලුත්වැඩියා කිරීමේ හෝ අලුත් කිරීමේ;

iii. වාසස්ථානයක් ගොඩනැගීම සඳහා යම් ඉඩමක් මිලදී ගැනීමේ හෝ බදු ගැනීමේ;

iv. වාසස්ථානයක් ගොඩනැගීමේ, අලුත්වැඩියා කිරීමේ, අලුත් කිරීමේ හෝ විශාල කිරීමේ;

v. වාසස්ථානයක් මිලදී ගැනීමේ හෝ බදු ගැනීමේ;

vi. වෙළඳ පොළෙහි විකිණීම සඳහා යම් කෘෂිකාර්මික හෝ කාර්මික නිෂ්පාදනයක් හෝ වෙළඳ භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ හෝ පිළියෙළ කිරීමේ;

vii. ඉහත සඳහන් අනුච්ඡේද අතුරින් යම් අනුච්ඡේදයක සඳහන් යම් කාර්යයකට ආනුෂංගික, අනුබද්ධ හෝ අනුයාත යම් කාර්යයක් කිරීමේ;

viii. ඉහත සඳහන් අනුච්ඡේද අතුරින් යම් අනුච්ඡේදයක සඳහන් යම් කාර්යයක දී එවකටත් දරා ඇති යම් ණයක් ගෙවා අවසන් කිරීමේ

එසේම එහි ව්‍යාපාරික කටයුතු වලට අදාලව 1981 අංක 62 දරණ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධිත) පනත මගින් යම් වෙනස් කිරීම් සහ අළුත් ඡේද ඇතුලත් කිරීමද කර ඇත.

දැක්ම - vision

ශ්‍රී ලංකාවේ නිවාස හා මූල්‍ය සංවර්ධනයේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර - mission

විශිෂ්ඨතම නිවාස මූල්‍ය ආයතනය වශයෙන් එහි තත්වය ශක්තිමත් කර ගන්නා අතරම, තම මූල්‍ය අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිද්දෙන් අති විශිෂ්ඨ මූල්‍ය විසඳුම් සමග අපගේ සියළුම ගනුදෙනු කරුවන්ට සේවය කිරීමටත් අපගේ තැන්පතු කරුවන්ට ශක්තිමත් ආරක්‍ෂාව සහ නම්‍යතාවයෙන් යුතු ආකර්ෂණීය ලාභ ලබා දීමට අපි බැඳී සිටිමු.

අපගේ සේවකයන්ට ප්‍රමෝද ජනක රැකියා අවස්ථා සහ ප්‍රදාන ඇති කිරීමටද අපි බැඳී සිටිමු.

අපගේ කොටස් හිමියන්ට විශිෂ්ඨ ලාභ ලබා දීමට අපි ප්‍රයත්න දරමු.

ප්‍රජාවට තම ජීවිත වලට වැඩි සමීපව සිටින වගකිවයුතු පුරවැසියා වෙමු. එපමණක් නොව රාජ්‍ය නියාමකයන්ට ජාතික සංවර්ධනයේදී හවුල්කරුවෙක්ද වෙමු.

ආයතනික වටිනාකම්

අපගේ ව්‍යාපාර පවත්වාගෙන යාමේදී වහා ප්‍රතිචාර දක්වමින්ද නිර්මානශීලීව ක්‍රියාකරමින්ද පහත සඳහන් දැයට බැඳී සිටිමු.

- විශ්වාසය.
- ගෞරවය.
- උත්තරදායීතාව.
- අධිවෘත්තිකතාව.
- විශ්වසනීයත්වය.
- සාධාරණය.
- කාර්යක්‍ෂමතාවය.
- සමාජ වගකීම.

(රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ 2008 වාර්ශික වාර්තාව.)

2009-2013 සංගත සැලැස්ම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 1975 ආරම්භ වී රජය සතු විශේෂ මූල්‍ය ආයතනයක් ලෙස දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. මෑතක් වන තෙක් එය ලාබදායි ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන ආ අතර මීට වසර කීපයකට පෙර නිවාස මූල්‍ය සැපයුම් ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම පැවති ආයතනයකි. නමුත් වසර තුන හතරක සිට බැංකුව සතු මූල්‍ය වෙළඳපල මට්ටම පහත බසිමින් සිටී. එම නිසා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව අනෙකුත් තරගකාරී ආයතන මෙන් වෙනස්වීම් සහිතව හොදින් ක්‍රියාත්මක වීමේ අවශ්‍යය තාවය පෙන්නුම් කරයි. වසර 2009 සිට 2013 දක්වා වූ සංගත සැලැස්ම මගින් ඉදිරි වසර 5 සඳහා ක්‍රියාත්මක වීමේ යෝජනා වලියක් ඇතුලත් වේ. එම ක්‍රියාන්විතය තුලින් මෙම ආයතනය නිවාස සංවර්ධන මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වනු ඇත.

මෙම බැංකුවේ කාර්යයන් වන්නේ නිවාස සංවර්ධනය,කෘෂිකාර්මික,කාර්මික ව්‍යාපාරික හෝ කෘෂිකාර්මික යන්ත්‍ර උපකරණ සඳහා නිශ්චල දේපල උකස් කරයක් මත මූල්‍ය පහසුකම් සලසා දීමයි.එයට අමතරව කෘෂිකාර්මික හා කාර්මික කලමනාකරණයක් පවත්වා ගැනීමට සහ ගනුදෙනු කරුවන්ගේ අයිතිය ආරක්ෂා කිරීමට තාක්ෂනික හා උපදේශක සේවා ලබාදීම සිදුකිරීමයි.

ඉදිරි වසර පහ තුල රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව තුල ප්‍රධාන ක්‍රියාකාරීත්වයන් 6ක් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

එනම්,

1. තැන්පතු වර්ධනය හා පවත්වා ගෙන යාම.

- නව නිශ්පාදන හා සේවාවන්, කඩිනම් සේවය, තැන්පතු සඳහා ඉහල පොලිය හා අලෙවි ප්‍රවර්ධනය.